# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත

---

**[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 අගෝස්තු මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 13.50 යි.** තැපැල් ගාස්තුව : රු. **6.75 යි.**

# 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත

[සහතිකය සටහන් කළේ 2003 ජුලි මස 30 වන දින.]

එල්. ඩී. – ඕ. 30/ 2002.

**විශේෂ වර්ගවල ආරාවුල් සමථ කිරීම මගින් නිරවුල් කිරීම පිණිස සමථ මණ්ඩල පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*පනත අදාළ විය යුතු විෂයය හා කාරණා.*

**2.** (1) මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය යුතු වර්ගවල ආරාවුල් සමථයට පත්කිරීම මගින් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) එම වර්ග කවරේ දැයි නිශ්චය කිරීමේ දී අමාත්‍යවරයා විසින් සමාජමය සහ ආර්ථික ප්‍රශ්න පිළිබඳ ආරාවුල් අර්ථවත් ලෙස විසඳීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගත යුතු ය.

*විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ.*

**3.** 2 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන වර්ග එකක හෝ වැඩි ගණනක ආරාවුල් නිරවුල් කිරීම, මේ පනතේ විධිවිධාන යටතේ සිදු කළ යුතු (මෙහි මින් මතු "විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශය කවරේ දැයි, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

*සමථකාරවරුන්ගේ මූල මණ්ඩලය පත්කිරීම.*

**4.** (1) 3 වන වගන්තිය යටතේ නියමයක් පළ කරනු ලැබූ විට, සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින්, අවශ්‍ය සියලු පියවර ගෙන (මෙහි මින් මතු "මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමථකාරවරයන්ගේ මූල මණ්ඩලයක්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එක් එක් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කළ යුතු ය. මේ පනතේ උපලේඛනයේ අන්තර්ගත විධිවිධාන, මූල මණ්ඩලයට සාමාජිකයන් තෝරා ගැනීම සහ පත් කිරීම සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මූල මණ්ඩලයක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වීමට, තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු සුදුසුකම් යම් තැනැත්තකුට තිබිය යුතු අතර, ඒ සුදුසුකම් නියම කිරීමේ දී, 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආරාවුල් වර්ගවල ස්වභාවය අනුව ඒ මූල මණ්ඩලවලට පත් කරනු ලබන සාමාජිකයන්ට තිබිය යුතු ප්‍රවීණත්වය පිළිබඳව අමාත්‍යවරයා සැළකිලිමත් විය යුතු ය. ඒ වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන විවිධ වර්ගවල ආරාවුල් වෙනුවෙන් එකිනෙකට වෙනස් සුදුසුකම් නියම කරනු ලැබිය හැකි ය.

(3) එක් එක් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය වෙනුවෙන් පත්කරන මූල මණ්ඩලයේ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු, ඒ මූල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

මූල මණ්ඩල සාමාජිකයන්ගේ ධූර කාලය සහ මවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය.

5. (1) මූල මණ්ඩලයේ සාමාජිකයකු පත්කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු අතර, ඉන් පසුව නැවත පත්කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුස්සෙක් විය යුතු ය.

(2) මූල මණ්ඩලයේ සාමාජිකයකුට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු ය.

මූල මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම.

6. මූල මණ්ඩලයේ සාමාජිකත්වයෙහි ඇති වන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පත්කිරීම් කරනු ලැබිය හැකි අතර, එසේ පත්කරනු ලබන සෑම තැනැත්තකු ම, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද, ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය.

විශේෂ සමථ මණ්ඩලවල බලතල.

7. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ යම් සමථ මණ්ඩල ප්‍රදේශයක් තුළ මේ පනතේ 2 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ ආරාවුල් වර්ග එකක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳව උද්ගතවන යම් ආරාවුලක්, සමථ කිරීම මගින් නිරවුල් කරගැනීම සඳහා යම් තැනැත්තකු විසින්, ඒ විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත්කර සිටින මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත, ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එසේ සභාපතිවරයා වෙත යොමු කරන ලද අවස්ථාවක, ඒ ආරාවුල –

(අ) චංචල හෝ නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන විට, ඒ චංචල දේපළ තබාගෙන ඇත්තේ හෝ ඒ නිශ්චල දේපළ පිහිටා ඇත්තේ යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක් ඇතුළත ද, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත්කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම් කරනු ලැබිය යුතු ය ;

(ආ) ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම ඇතිකර ගන්නා ලද්දේ යම් සමථ මණ්ඩල ප්‍රදේශයක් ඇතුළත ද, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත්කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම කරනු ලැබිය යුතු ය ; සහ

(ඇ) අධිකරණයක නඩු නිමිත්තක් සංයුක්ත වන කාරණයක් සම්බන්ධයෙන් වන විට ඒ නඩුව සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශ සීමාව ඇතුළත ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම කරනු ලැබිය යුතු ය.

(2) සෑම ඉල්ලීමක් ම, නියමිත ගාස්තුව නියමිත ආකාරයෙන් ගෙවා ඇති බවට සාක්ෂියක් වන ලියවිල්ලක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නිරවුල් නොකිරීමේ සහතිකයක් නොමැතිව කිසිදු නඩුවක් නොපවරනු ලැබිය යුතු බව.

**8.** (1) මේ පනත යටතේ විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් මූල මණ්ඩලයක් පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන ආරාවුල් වර්ග එකක් හෝ ඊට වැඩිගණනක් පිළිබඳව ඒ ප්‍රදේශය තුළ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ උද්ගත වන යම් ආරාවුලක් සම්බන්ධ කිසිදු නඩු කටයුත්තක්, ඒ ආරාවුලෙහි විෂය වස්තුවේ මූල්‍ය වටිනාකම, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක නිශ්චිතව දැක්වෙන යම් මුදල් ප්‍රමාණයකට අඩුවන්නා වූ අවස්ථාවක, 14 වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ නිකුත්කරන ලද නිරවුල් නොකිරීමේ සහතිකයක් සහිතව මිස, මුල් අවස්ථා අධිකරණයක පැවරීම හෝ ඒ අධිකරණයක් විසින් භාරගැනීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි කවර විධිවිධානයක් තිබුණ ද, එම උපවගන්තියෙහි සඳහන් ආරාවුලක පාර්ශ්වයක් විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ V වන කොටස යටතේ වූ තාවකාලික ප්‍රතිකර්මයක ආකාරයේ සහනයක් සඳහා අයැදුමක් කර ඇති අවස්ථාවක, හෝ 7 වන වගන්තිය යටතේ යම් ආරාවුලක සම්බන්ධව ඉල්ලීමක් කර ඇති ඒ ආරාවුලෙහි පාර්ශ්වකරුවකු විසින්, පසුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ V වන කොටස යටතේ වූ තාවකාලික ප්‍රතිකර්මයක් ප්‍රදානය කරන ලෙස වූ අයැදුමක් ද ඇතුළත්ව, ඒ ආරාවුල පිළිබඳව කවර හෝ අධිකරණයක නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තාවකාලික ප්‍රතිකර්මය ප්‍රදානය කිරීමට අදාළ වන තාක්දුරට පමණක් ඒ නඩුව විභාග කිරීම සහ තීරණය කිරීම ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. ඒ තීරණය කිරීමෙන් පසුව -

(අ) ඒ අධිකරණය ඉදිරියෙහි වූ නඩුවේ නඩු නිමිත්ත සංයුක්ත වන ආරාවුල සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කර නොමැති අවස්ථාවක, ඒ ආරාවුල සමථයට පත්කිරීම සඳහා, නිසි මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කළ යුතු ය ; නැතහොත්

(ආ) ඒ ආරාවුල සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආරාවුල සමථයට පත්කිරීමේ කටයුතු කරගෙන යන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ වන විට මූල මණ්ඩලයක් පත්කර නොමැති නම්, නිසි මූල මණ්ඩලයේ සභාපතිවරයාට හෝ මණ්ඩලයක් පත්කර ඇත්නම් ඒ නිසි මණ්ඩලයට හෝ විධාන කළ යුතු ය.

(3) ඉල්ලීම කරන ලද්දේ යම් ආරාවුලක් පිළිබඳව ද, ඒ ආරාවුලේ විෂය වස්තුවෙහි මූල්‍ය වටිනාකම රුපියල් විසිපන් දහසක් ඉක්මවන්නේ නම් මිස (1) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවකින් 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩලයක් වෙත, ආරාවුලේ කවර හෝ පාර්ශ්වකරුවකු විසින් ඉල්ලීමක් කිරීම වළක්වනු නොලබන්නේ ය.

අධිකරණයක් විසින් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් යොමු කිරීම.

**9.** මේ පනතේ 2 වන වගන්තිය යටතේ නියමය කරන ලද ආරාවුල් වර්ග එකක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳව උද්ගත වී තිබෙන ආරාවුලක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි යම්

විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක් කෙරෙහි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් හෝ යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක් කෙරෙහි අධිකරණ බලය ඇති කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත නඩුවක් හෝ ඉල්ලීමක් කර ඇති අවස්ථාවක ඒ ආරාවුල සමථය කර නිරවුල් කිරීම පිණිස, ඒ ආරාවුලේ පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව, ඒ විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත්කර තිබෙන මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත, ඒ ආරාවුල එම අධිකරණය හෝ විනිශ්චය අධිකාරය විසින් යොමු කරනු ලැබිය හැකි ය.

සමථ මණ්ඩල පිහිටුවීම.

10. (1) 7 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට හෝ 9 වන වගන්තිය යටතේ තමා වෙත යොමු කිරීමක් ලැබුණු විට, සමථ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ආකාරය සම්බන්ධයෙන් මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් ආරාවුලේ පාර්ශ්වකරුවන්ගෙන් විමසා දැනගත යුතු අතර, එසේ ප්‍රකාශිත මනාපයට අනුකූලව :—

(අ) (2) වන උපවගන්තිය යටතේ සමථ මණ්ඩලයක් පිහිටුවීම ; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ කලින් පිහිටුවන ලද සමථ මණ්ඩලයක් තෝරා ගැනීමට ආරාවුලේ පාර්ශ්වකරුවන්ට ඉඩ දීම ,

කරනු ලැබිය යුතු ය.

(2) ආරාවුලේ සියලු පාර්ශ්වකරුවන්, (1) වන උපවගන්තිය යටතේ සමථ මණ්ඩලයක් පිහිටුවීමට මනාපය පළ කරනු ලබන අවස්ථාවක, ඒ විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත්කරන ලද මූල මණ්ඩලයෙන්,

(අ) ආරාවුලේ එක් එක් පාර්ශ්වය විසින් තෝරා ගන්නා එක් එක් සාමාජිකයකුගෙන් ; සහ

(ආ) (අ) ඡේදය යටතේ තෝරාගන්නා ලද සාමාජිකයන් විසින් තෝරාගන්නා එක් සාමාජිකයකුගෙන්,

සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන්දෙනකුගෙන් සැදුම්ලත් සමථ මණ්ඩලයක්, මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් පිහිටුවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, (අ) ඡේදයේ සඳහන් ආරාවුලේ පාර්ශ්වකරුවනට හෝ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයන්ට පිළිවෙලින් ඔවුන්ගේ තෝරාගැනීම් සම්බන්ධයෙන් එකඟත්වයට පැමිණීමට නොහැකිවන අවස්ථාවක, මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය තේරීම කරනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත්, (අ) ඡේදයේ සඳහන් ආරාවුලේ පාර්ශ්වකරුවකු විසින් ඒ ඡේදය යටතේ තෝරාගැනීමක් කිරීමට ඔහුගේ අකමැත්ත ලියවිල්ලක් මගින් ප්‍රකාශ කරනු ලැබුවහොත්, මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් එම තේරීම කළ යුතු ය. එසේ කුසපත් ඇද පළමුව තෝරාගන්නා සාමාජිකයාට කවර හෝ හේතුවක් නිසා ඒ පාර්ශ්වකරු විරෝධයක් දැක්වුවහොත්, සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් තවදුරටත් තෝරාගැනීමක් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීම හෝ යොමු කිරීම කරනු ලබන්නේ යම් ආරාවුලක් සම්බන්ධව ද, ඒ ආරාවුල පූර්වයෙන් පිහිටුවන ලද මණ්ඩලයකට යොමුකිරීම පිළිබඳව ආරාවුලේ සියලු පාර්ශ්වකරුවන් මනාපය ප්‍රකාශ කරන අවස්ථාවක, විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ සඳහා පත් කළ මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් පූර්වයෙන් පිහිටුවන ලද (සභාපතිවරයා විසින් පත්කළ ප්‍රධාන සමථකාරවරයකු ද ඇතුළුව) සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත මණ්ඩල අතරින් යම් මණ්ඩලයක් තෝරාගැනීමට, පාර්ශ්වකරුවන්ට මූල මණ්ඩල සභාපතිවරයා විසින් ඉඩ දෙනු ලැබිය යුතු ය.

(4) ආරාවුලේ සියලු පාර්ශ්වකරුවන් එම ආරාවුල (2) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩලයකට යොමු කිරීම පිළිබඳව මනාපය ප්‍රකාශ කරන අවස්ථාවක, ඒ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරාගනු ලැබූ, (මෙහි මින් මතු "ප්‍රධාන සමථකාරවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයා, මණ්ඩලයේ ප්‍රධාන සමථකාරවරයා ලෙස ක්‍රියා කළ යුතු ය :

එසේ වුව ද, මූල මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරාගෙන තිබෙන අවස්ථාවක දී සභාපතිවරයා එහි ප්‍රධාන සමථකාරවරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය පිහිටුවීමෙන් හෝ තෝරාගනු ලැබීමෙන් පසුව ඉල්ලීම හෝ යොමු කිරීම කර ඇත්තේ යම් ආරාවුලක් පිළිබඳව ද, ඒ ආරාවුල සමථ කිරීමෙන් බේරුම් කිරීම සඳහා මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඒ මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

11. 10 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යම් මණ්ඩලයක් වෙත ආරාවුලක් යොමු කරනු ලැබූ අවස්ථාවක, සියලු නීත්‍යනුකූල ක්‍රියා මාර්ගවලින් ඒ ආරාවුලේ පාර්ශ්වයන් අතර සුහද නිරවුල් කිරීමක් ඇති කිරීම පිණිස ප්‍රයත්න දැරීම ද, එම ආරාවුල නැවත ඇතිවීම වැළැක්වීම පිණිස පාර්ශ්ව අතර පවත්නා දුක්ගැනවිල්ලේ නියම හේතුව හැකි සෑම අවස්ථාවක ම ඔවුන්ගේ එකහත්වය ඇතිව ඉවත් කිරීම ද, ඒ මණ්ඩලයේ කාර්යය විය යුතු අතර, මේ කාර්ය සඳහා මණ්ඩලය විසින් – මණ්ඩලයක කාර්යය.

(අ) දන්වනු ලබන වේලාවක සහ ස්ථානයක පැවැත්වෙන සමථ කිරීමේ සාකච්ඡාවට එක්ව හෝ වෙන් වෙන්ව පැමිණ සිටින ලෙස අදාළ පාර්ශ්වකරුවන්ට සහ අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් තැනැත්තන්ට දැනුම් දිය යුතු අතර, පාර්ශ්වකරුවන් අතරින් යම් පාර්ශ්වකරුවකු ඒ සාකච්ඡාවට පැමිණීම පැහැර හැරියහොත් එම පාර්ශ්වකරුගේ නොපැමිණීම මණ්ඩලය නිකුත් කරන නිරවුල් නොකිරීමේ සහතිකයෙහි හෝ 14 වන වගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරන වාර්තාවෙහි ප්‍රකාශ කරන බව ද දැනුම් දීමේ සඳහන් කළ යුතු ය ;

(ආ) නිරවුල් කිරීමක් ඇති කර ගැනීමට ආධාර විය හැකි යම් සාක්ෂිකරුවන් කැටුව හෝ ලියකියවිලි රැගෙන ඒ සාකච්ඡාවට එන ලෙස, එසේ පැමිණ සිටින මෙන් දන්වනු ලබන යම් තැනැත්තකුට නියම කළ යුතු ය ;

(ඇ) නිරවුල් කිරීමක් ඇති කිරීම සඳහා අවශ්‍ය තරම් සමථ කිරීමේ සාකච්ඡා ගණනාවක් කැඳවිය යුතු ය ;

(ඈ) සමථ කිරීමේ සාකච්ඡා වාර පැවැත්වීමේ දී පිළිපැදිය යුතු නියමිත කාර්ය පටිපාටිවලට අනුකූලව කටයුතු කළ යුතු ය ;

(ඉ) සමථ කිරීමේ සාකච්ඡා වාර පැවැත්වීමේ දී දෙන සියලු සාක්ෂි, ඉදිරිපත් කරන ලේඛන සහ එහි දී හෙළිදරව් කරන හෝ සාකච්ඡා කරන වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගත යුතු ය :

(ඊ) නිරවුල් කිරීමක් ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය යයි සහ උපකාරී වේ යයි මණ්ඩලය සලකන අවස්ථාවල දී, ආරාවුලේ විෂය කාරණයට අදාළ විශේෂ දැනීමක් හෝ ප්‍රවීණත්වයක් ඇති යම් තැනැත්තකුගේ උපදෙස් ලබාගත යුතු ය ;

(උ) ආරාවුලේ දෙපාර්ශ්වයට ම පිළිගත හැකි නිරවුල් කිරීමකට එළඹීමට ප්‍රයත්න දැරිය යුතු ය : සහ

(ඌ) 15 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත, මණ්ඩලයේ නීති කෘත්‍ය සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වූ විටක, අවස්ථාවෝචිත පරිදි 14 වන වගන්තිය යටතේ, නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම හෝ අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ කළ යුතු ය.

ආරාවුලක පාර්ශ්වකරුවන්ගේ කාර්ය.

**12.** (අ) නිරවුල් කිරීමක් ඇතිකරගැනීම සඳහා අදාළ හා අවශ්‍ය සියලු කාරණා සම්පූර්ණයෙන් හා අවංකව හෙළිදරව් කිරීම ;

(ආ) සමථ සාකච්ඡා වාරයක දී හෙළිදරව් කරන හෝ සාකච්ඡා කරන රහස්‍ය ස්වභාවයේ තොරතුරු අනාවරණය කිරීමෙන් වැළකීම,

සමථය කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය ඉදිරියට ගෙන එනු ලබන ආරාවුලක සෑම පාර්ශ්වකරුවකුගේ ම කාර්යය විය යුතු ය.

නිරවුල් කිරීමක් ඇති කරගන්නා ලද අවස්ථාවක.

**13.** (1) ආරාවුලක පාර්ශ්වකරුවන් නිරවුල් කිරීමකට එකඟ වූ අවස්ථාවක නිරවුල් කිරීමේ නියමයන් ලේඛනගත කළ යුතු අතර, ප්‍රධාන සමථකාරවරයා විසින් සහ එම පාර්ශ්වකරුවන් විසින් ඊට අත්සන් කරනු ලැබිය යුතු ය. තවද, මණ්ඩලය විසින්-

(අ) ඒ නිරවුල් කිරීම, 7 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මගින් මණ්ඩලය ඉදිරියට ගෙන එන ලද යම් ආරාවුලක් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමක් වන අවස්ථාවක, ඒ ආරාවුලේ එක් එක් පාර්ශ්වකරුට එහි පිටපතක් බැගින් නිකුත් කළ යුතු ය : සහ

(ආ) ඒ නිරවුල් කිරීම 9 වන වගන්තිය යටතේ අධිකරණයක් විසින් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් යොමු කරන ලද යම් ආරාවුලක් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය වෙත එහි පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ ආරාවුලේ එක් එක් පාර්ශ්වකරුවකුට ද එහි පිටපතක් බැගින් නිකුත් කළ යුතු ය.

(2) නිරවුල් කිරීමේ පිටපතක් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් අධිකරණයක් වෙත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, එම අධිකරණය හෝ විනිශ්චය අධිකාරය විසින්, ආරාවුලේ පාර්ශ්වකරුවන්ට දැනුම් දීමෙන් පසුව, ඒ නිරවුල් කිරීම අනුව –

(අ) අධිකරණයක් විසින් කරන ලද යොමු කිරීමක් වන විට, තීන්දු ප්‍රකාශයක් සටහන් කිරීම ; හෝ

(ආ) කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද යොමු කිරීමක් වන විට, ආඥාවක් කිරීම,

කරනු ලැබිය යුතු ය.

**14.** ආරාවුලක පාර්ශ්වකරුවන් නිරවුල් කිරීමකට එකඟ නොවූ අවස්ථාවක, මණ්ඩලය විසින් – නිරවුල් කිරීමක් කළ නොහැකි අවස්ථාවක.

(අ) 7 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත මණ්ඩලය වෙත යොමු කරන ලද ආරාවුලක් සම්බන්ධයෙන් වන විට, ඒ ආරාවුල ඒ මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ බවත්, සමථ කිරීමෙන් ඒ ආරාවුල නිරවුල් කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කර, ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කළ නියමිත ආකෘතියෙහි වූ නිරවුල් නොකිරීමේ සහතිකයක්, එසේ නිරවුල් කළ නොහැකි වීමට හේතු ද එහි ප්‍රකාශ කරමින්, නිකුත් කළ යුතු ය;

(ආ) නිරවුල් කිරීම සඳහා යම් අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් 9 වන වගන්තිය යටතේ යොමු කරන ලද ආරාවුලක් සම්බන්ධයෙන් වන විට, ඒ ආරාවුල සමථ කිරීමෙන් නිරවුල් කිරීමට නොහැකි වූ බව සහ එය එසේ නිරවුල් කිරීමට නොහැකි වීමට

හේතු ප්‍රකාශ කරන නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක්, ප්‍රධාන සමථකාරවරයාගේ අත්සනින් යුතුව, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කළ යුතු ය.

මණ්ඩලය ක්‍රියා කළ යුතු කාලසීමාව.

**15.** (1) සමථ කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය ඉදිරියට ගෙන එනු ලබන සෑම ආරාවුලක් සම්බන්ධව ම, 10 වන වගන්තියේ විධිවිධානවලට අනුව ඒ මණ්ඩලය පිහිටුවනු ලැබීමෙන් දින හැටක් ඇතුළත ඒ පිළිබඳ සලකා බැලීම් නිම කර, අවස්ථාවෝචිත, පරිදි නිරවුල් කිරීමක් ඇති කර ගැනීමට හෝ නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීමට හෝ ප්‍රයත්න දැරිය යුතු ය.

(2) මණ්ඩලයක් විසින් සමථ කිරීමේ සැසිවාරයක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

සාමාජිකයන් ආචාරධර්ම සංග්‍රහයකින් බැඳී සිටින බව.

**16.** සමථ කිරීමේ සැසිවාරයක් පැවැත්වීමේ දී මණ්ඩලයේ සාමාජිකයන් නියම කරනු ලබන පරිදි වූ ආචාර ධර්ම සංග්‍රහයකින් බැඳී සිටිය යුතු ය.

නිරවුල් කිරීම අනුව ක්‍රියා නොකිරීම හෝ එය උල්ලංඝනය කිරීම.

**17.** (1) 7 වන වගන්තිය යටතේ කළ ඉල්ලීමක් අනුව මණ්ඩලයකට යොමු කරන ලද යම් ආරාවුලක් නිරවුල් කරනු ලැබුවා වූ සහ ඒ නිරවුල් කිරීමේ පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වකරුවකු විසින් යම් වේලාවක නිරවුල් කිරීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ හෝ ඒ නියමයන් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ පැහැර හැරීම හෝ උල්ලංඝනය කිරීම අනෙක් පාර්ශ්වකරු විසින් වහාම මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු පසු, මණ්ඩලය විසින් නිරවුල් කිරීමේ පාර්ශ්වකරුවන්ට සහ උචිත යයි සලකනු ලබන වෙනත් තැනැත්තන්ට නියමිත වේලාවක නියමිත ස්ථානයකට පැමිණ සිටින ලෙස දැනුම් දිය යුතු අතර, ඔවුන් අතර පැන නැඟී තිබිය හැකි යම් මතභේද නිරාකරණය කිරීමට ප්‍රයත්න දැරිය යුතු අතර, අලුත් නිරවුල කිරීමක් ඇතිකර ගැනීමෙහි ලා ඔවුන්ට සහාය විය යුතු ය. එවැනි මතබේද නිරාකරණය කළ නොහැකි අවස්ථාවක, මණ්ඩලය විසින්, ඒ ආරාවුල නිරවුල් කිරීමට නොහැකි බව සඳහන් කර ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ නිරවුල් නොකිරීමේ සහතිකයක්, ඒ නිරවුල් නොකිරීමට හේතු වූ කරුණු ද සඳහන් කරමින් නිකුත් කළ යුතු ය.

නිරවුල් නොකිරීමේ සහතික සාක්ෂිවල දී භාරගත හැකි බව.

**18.** (1) 14 වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බවට උද්දේශිත, ප්‍රධාන සමථකාරවරයා අත්සන් කළ නිරවුල් නොකිරීමේ සහතිකයක්, ඒ තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් කැඳවනු නොලැබුව ද, කවර හෝ අධිකරණයක පවරන ලද නඩුවක දී හෝ නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) යම් නිරවුල් නොකිරීමේ සහතිකයක ඇති අත්සන සත්‍ය බවට සහ එය අත්සන් කළ තැනැත්තා එය අත්සන් කළ වේලාවේ දී දැරූ බව කියා පාන ධුරය දරමින් සිටි බව, අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය :

එසේ වුව ද, යම් නඩුවක දී ප්‍රධාන සමථකාරවරයා සාක්ෂි දීම සඳහා ඒ අධිකරණය ඉදිරියේ වූ යම් නඩු කටයුතුවල දී පැමිණ සිටිය යුතු බව, යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට හෝ අන්‍යාකාරව සහ වාර්තාගත කළ හේතු අනුව අධිකරණයේ මතය වන්නේ නම්, හුදෙක් එම සහතිකය අත්සන් තැබීම සම්බන්ධයෙන් සාක්ෂි දීමේ කාර්යය සඳහා ම ඒ ප්‍රධාන සමථකාරවරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබිය යුතු ය.

නියෝජනය.

**19.** මණ්ඩලයක් ඉදිරියෙහි වූ යම් කාරණයක දී, ආරාවුලක යම් පාර්ශ්වකරුවකු වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයකුට හෝ අනුයෝජිතයකුට හෝ වෙනත් තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු අතර, ඒ සඳහා අවසර නොදිය යුතු ය :

එසේ වුව ද, මණ්ඩලයක් ඉදිරියෙහි –

(අ) එක් කලත්‍රයකු විසින් අනෙක් කලත්‍රයා ; හෝ

(ආ) ඔහුගේ මව හෝ පියා විසින් බාලවයස්කරුවකු හෝ යම් අබලතාවකින් යුතු වෙනත් තැනැත්තකු, භාරකරු හෝ දේපළ ආරක්ෂක විසින්,

නියෝජනය කරනු ලැබීමට අවසර දිය යුතු ය.

සාක්ෂිකරුවන් සහ වරප්‍රසාද.

**20.** (1) අධිකරණයක් ඉදිරියෙහි සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමිකම ඇති සියලු වරප්‍රසාද, මණ්ඩලයක් ඉදිරියෙහි ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකුට ම ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් හිමි විය යුතු ය.

(2) මණ්ඩලයක් ඉදිරියෙහි යම් තැනැත්තකු විසින් කරන ලද කිසිම ප්‍රකාශයක් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ආවේශ්‍ය කරගත නොහැකි විය යුතු ය.

කාලාපගමනය.

**21.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද යම් නඩු නිමිත්තක් හා සම්බන්ධව කාලාපගමන කාලසීමාව ආගණනය කිරීමේ දී, ඒ නඩු නිමිත්ත සංයුක්ත වන ආරාවුල සම්බන්ධයෙන් සමථකාරවරයන්ගේ මූල මණ්ඩලයක සභාපතිවරයා වෙත ඉල්ලීමක් කරන ලද දිනයෙන් ආරම්භව, ඒ ආරාවුල සම්බන්ධයෙන් 14 වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ නිකුත් කරන සහතිකයේ දිනයෙන් අවසන් වන කාලසීමාව, සැලකිල්ලට නොගත යුතු ය.

ග්‍රාමසේවා නිලධරයන් මණ්ඩලයට සහාය විය යුතු බව.

**22.** යම් මණ්ඩලයක් විසින් 11 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සහ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ එහි කාර්ය කරගෙන යාමේ දී, ආරාවුලක යම් පාර්ශ්වකරුවකුට හෝ වෙනත් තැනැත්තකුට යම් දැනුම් දීමක් කිරීම පිණිස සහාය දෙන ලෙස විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය ඇතුළත යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා පත්කර සිටින ග්‍රාම නිලධරයකුට නියම කරනු ලැබිය හැකි අතර. එසේ නියම කරනු ලැබූ විට ඒ ග්‍රාම නිලධරයා විසින්, ඒ මණ්ඩලයට ඒ සඳහා අවශ්‍ය සියලු සහාය දිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**23.** මේ පනත යටතේ පිහිටුවනු ලබන සෑම මණ්ඩලයකම සාමාජිකයන්, ඔවුන් ඒ සාමාජිකයන් ලෙස ක්‍රියා කරන තාක් කල්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය. තවද ඒ මණ්ඩලය ඉදිරියේ පැවැත්වෙන සෑම කටයුත්තක් ම, ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූලව නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**24.** මේ පනත යටතේ පිහිටුවනු ලබන සෑම මණ්ඩලයක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

**25.** මණ්ඩලයක් පිහිටුවීමෙහි ලා වූ දෝෂයක් පමණක් හේතු කොට ගෙන, මණ්ඩලයේ ක්‍රියාවක් හෝ එහි කටයුතු හෝ අවලංගු නොවන බව සැලකිය යුතු ය.

මණ්ඩලය පිහිටුවීමෙහි ලා වූ දෝෂයකින් එහි ක්‍රියා සහ කටයුතු අවලංගු නොවිය යුතු බව.

**26.** (1) සමථයට යොමු කිරීමේ ගිවිසුමක් යටතේ යම් ආරාවුලක් සමථ කිරීම සඳහා යොමු කිරීමට එහි පාර්ශ්වකරුවන් එකඟ වී ඇති අවස්ථාවක, ඒ ආරාවුල මේ පනතේ 2 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද ආරාවුල් වර්ග එකක් හෝ ඊට වැඩි ගණනක් තුළට වැටෙන ආරාවුලක් වූ විට එයට පටහැනිව වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ ආරාවුල, සමථ කිරීම සඳහා යොමු කර ඇති බවට සහ බේරුම් කිරීමක් කළ නොහැකි වූ බවට ප්‍රමාණවත් ලේඛනගත සාක්ෂි භාර දී ඇත්නම් මිස කිසිදු නඩු කටයුත්තක් අධිකරණයක පැවරීම හෝ අධිකරණයක් විසින් භාර ගැනීම හෝ නොකළ යුතු ය.

සමථයකට යොමු කිරීමේ ගිවිසුමක් ඇති අවස්ථාවක, බේරුම් නොකරන ලද බවට ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව, නඩු පවරනු නොලැබිය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ආරාවුලක පාර්ශ්වයක් විසින්, සිවිල් නඩුවිධාන සංග්‍රහයේ V වන කොටස යටතේ යම් තාවකාලික ප්‍රතිකර්මයක ආකාරයේ සහනයක් සඳහා අයැදුමක් කර ඇති නඩුවක් සම්බන්ධයෙන්, ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, එම තාවකාලික ප්‍රතිකර්මය ප්‍රදානය කිරීම පිළිබඳව වන තාක් දුරට පමණක්, අධිකරණයක් විසින් ඒ නඩුව භාරගෙන නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා සමථයට යොමු කිරීමේ ගිවිසුමක්, ගිවිසුම්ගත වුව ද නොවුව ද, නෛතික සම්බන්ධතාවයකට අදාළව, පාර්ශ්වයන් විසින් ඔවුන් අතර පැන නගින යම් ආරාවුලක් හෝ සියලුම ආරාවුල් සමථ කිරීම සඳහා යොමු කිරීමට එකඟත්වයක් ඇති කරගනු ලබන, කොන්ත්‍රාත්තුවක ඇතුළත් සමථ කිරීමේ වගන්තියක ආකාරයෙන් නැතහොත් වෙනම සමථ කිරීමේ ගිවිසුමක ආකාරයෙන් විය හැකි ය.

**27.** (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැලකිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලද දිනය ලෙස සැලකෙන දිනය පිළිබඳ දැනුම්දීමක් ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**29.** මේ පනතෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"සමථ මණ්ඩල කොමිෂන් සභාව" යන්නෙන්, 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත යටතේ පත්කරන ලද සමථ මණ්ඩල කොමිෂන් සභාව අදහස් වේ.

**උපලේඛනය** [4(1) වගන්තිය]

1. අමාත්‍යවරයා විසින් 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියම කරන සුදුසුකම් දරන තැනැත්තන් කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තන් මූල මණ්ඩලයේ සාමාජිකයන් ලෙස පත් කිරීමට ප්‍රථම, සමථ කිරීමේ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳ මූලික පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා යැවිය යුතු ය.

2. ඉහත 1 වන අයිතමයේ සඳහන් මූලික පුහුණුව නිමකිරීමෙන් පසු පාඨමාලාව පවත්වන තැනැත්තා හෝ තැනැත්තන් විසින් පුහුණු පාඨමාලාව හැදෑරූ එක් එක් තැනැත්තා සම්බන්ධව වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ වාර්තාවෙහි සමථකාරවරයකු ලෙස ක්‍රියා කිරීමට ඒ පුහුණුවීම් ලාභියා සතු සහජ හැකියාව, දැනුම සහ දක්ෂතා ගැන අදහස් දක්වා තිබිය යුතු ය.

3. ඉහත 2 වන අයිතමයේ සඳහන් වාර්තා ලැබුණු විට, කොමිෂන් සභාව විසින් ඒ එක් එක් වාර්තාවෙහි අන්තර්ගත කරුණු සලකා බැලීමෙන් පසුව, සෑම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා ම -

(අ) දොළොස්දෙනකුට නොඅඩු තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත සමථකාරවරයන්ගේ මූල මණ්ඩලයක් ;

(ආ) ඒ යම් මූල මණ්ඩලයකට කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන අතිරේක සාමාජික සංඛ්‍යාවක් ;

(ඇ) මූල මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා අවශ්‍ය විය හැකි යම් සමාජිකයන් සංඛ්‍යාවක්,

පත් කරනු ලැබිය යුතු ය.

4. (1) ධූර කාලය ඉකුත් වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ධූරය හිස් කරන සභාපතිවරයා හෝ යම් සමාජිකයකු හෝ සිය ධූරය හිස් කරන දිනයේ දී යම් ආරාවුලක් විභාග කරමින් සිටි අවස්ථාවක මහුගේ ධූරය හිස් කිරීම මහු ඒ විභාගය සම්පූර්ණයෙන් අවසන් කරන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(2) ධූරය හිස් කරන සාමාජිකයකුගේ අනුප්‍රාප්තිකයා වශයෙන්, යම් හේතුවක් නිසා තැනැත්තකු පත් කර නොමැති අවස්ථාවක, ඉවත්වන සාමාජිකයා එසේ ධූරය හිස් කළ ද එය නොතකා, මහු වෙනුවට අනුප්‍රාප්තිකයකු පත්කරනු ලබන තෙක් හෝ කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් නිශ්චය කරන තෙක්, මූල මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් දිගටම සිටිය යුතු ය.

5. (1) සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු-

(අ) කොමිෂන් සභාව අමතා මහු විසින් යවනු ලබන ලිපියක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය :

(ආ) කොමිෂන් සභාව විසින්, හේතුවක් නොදක්වා, ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලා අස් වූ හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ සභාපතිවරයා හෝ යම් සාමාජිකයෙක් නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.